සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

**80 | S | I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2015 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2015 டிசெம்பர்
**General Certificate of Education (Ord. Level) Examination, December 2015**

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය I, II
தகவல் தொடர்பாடல் தொழினுட்பவியல் I, II
Information & Communication Technology I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

## තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි** හෝ **වඩාත් ගැළපෙන** පිළිතුර තෝරා ගන්න.

(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**

(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** පරිගණකයක මධ්‍යම සැකසුම් ඒකකය (CPU) පහත දක්වා ඇති කවරකින් සමන්විත වේ ද?

(1) අංක ගණිතමය හා තාර්කික ඒකකය (ALU), පාලන ඒකකය (CU), සංදර්ශකය (display unit)
(2) අංක ගණිතමය හා තාර්කික ඒකකය (ALU), පාලන ඒකකය (CU), ආදාන/ප්‍රතිදාන උපක්‍රම (I/O devices)
(3) අංක ගණිතමය හා තාර්කික ඒකකය (ALU), පාලන ඒකකය (CU), මතක රෙජිස්තර (memory registers)
(4) අංක ගණිතමය හා තාර්කික ඒකකය (ALU), පාලන ඒකකය (CU), ද්විතියික ආචයනය (secondary storage)


**2.** අන්තර්ජාලයට සම්බන්ධිත පරිගණක ජාලයක් මගින් ලැබෙන වාසියක් **නොවන්නේ** පහත සඳහන් දෑ අතුරෙන් කවරක් ද?


(1) අන්තර්ජාලයට සම්බන්ධිත, වෙනත් පරිගණක ජාලයක පිහිටි ගොනු සේවාදායකයක් (file server) වෙත ගොනු උපස්ථ (backup) කිරීම
(2) වයිරස හා ද්වේශසහගත මෘදුකාංග (malware) අවදානම අඩු වීම
(3) ජාලය තුළ ඇති සම්පත් හවුලේ භාවිතය
(4) වෙබ් භාවිතය


**3.** $P, Q, R$ ආදාන තුනක් සහ $F$ නම් ප්‍රතිදාන එකක් සහිත තර්කන පරිපථයක් සලකන්න. එම පරිපථයෙහි පහත නිරීක්ෂණ දක්නා ලදී :


- ඕනෑම එක් ආදානයක් 1 වේ නම්, ඉතිරි ආදාන කුමක් වුවද $F$ ප්‍රතිදානය 0 වේ.
- සියලු ම ආදාන 0 නම්, $F$ ප්‍රතිදානය 1 වේ.

ඉහත සඳහන් කළ පරිපථය සඳහා පහත කුමන තාර්කික පරිපථ වින්‍යාසය (configuration) වඩාත් ගැළපේ ද?

(1)



(2)



(3)



(4)



**4.** විභාගයකින් සුදුසුකම් ලැබීමට අයදුම්කරුවන් $S_1$ නම් වූ එක් අනිවාර්ය විෂයයක් හා අනතුරුව $S_2$, $S_3$ හා $S_4$ යන විකල්ප විෂයයන් අතුරෙන් එකක්වත් සමත් විය යුතු ය. මෙම සංසිද්ධිය නිවැරදි ව නිරූපණය වන්නේ පහත කවර බූලියන් ප්‍රකාශනයෙන් ද?

(1) $S_1$ AND ($S_2$ AND $S_3$ AND $S_4$)
(2) $S_1$ AND ($S_2$ OR $S_3$ OR $S_4$)
(3) $S_1$ OR ($S_2$ AND $S_3$ AND $S_4$)
(4) $S_1$ OR ($S_2$ OR $S_3$ OR $S_4$)

**5.** පහත දැක්වෙන කුමන අෂ්ටක සංඛ්‍යාව, දශමය 79 සංඛ්‍යාවට තුල්‍ය වේ ද?

(1) $117_8$ (2) $1017_8$ (3) $711_8$ (4) $7110_8$

**6.** පරිගණකයේ දත්ත ආචය (store) සඳහා පහත කුමන ආකාරය භාවිත වේ ද?

(1) ද්විමය (binary)
(2) දශමය (decimal)
(3) ෂඩ් දශමය (hexa-decimal)
(4) අෂ්ටක (octal)

**7.** පහත දැක්වෙන කුමන දශමය සංඛ්‍යාව, ද්විමය $110111_2$ සංඛ්‍යාවට තුල්‍ය වන්නේ ද?

(1) 55 (2) 63 (3) 110 (4) 118

[දෙවැනි පිටුව බලන්න.

**8.** $10001111_2, 170_8, 46687_{10}, 2F_{16}$ යන සංඛ්‍යා හතරේ ආරෝහණ පටිපාටිය නිරූපණය වන්නේ පහත කවරකින් ද?

(1) $170_8, 10001111_2, 2F_{16}, 46687_{10}$  (2) $10001111_2, 46687_{10}, 170_8, 2F_{16}$

(3) $2F_{16}, 170_8, 10001111_2, 46687_{10}$  (4) $46687_{10}, 10001111_2, 170_8, 2F_{16}$

**9.** භාවිත නොකරන ලද ඉඩ ප්‍රමාණය **අවම** වන සේ 4GB ධාරිතාවෙන් යුතු USB ආචයන උපක්‍රමයකට ආචය (store) කළ හැක්කේ 1 වන වගුවේ ඇති ගොනු අතුරෙන් කුමන ගොනු(ව) ද?

1 වන වගුව

| ගොනු නාමය (File name) | ප්‍රමාණය (Size) |
|---|---|
| A. doc | 300 MB |
| B. jpg | 740 MB |
| C. mp4 | 3 GB |

(1) A .doc හා B. jpg පමණි  (2) B.jpg හා C. mp4 පමණි

(3) C. mp4 පමණි  (4) ඉහත සියල්ලම

**10.** මෙහෙයුම් පද්ධති (OS) මෘදුකාංගයක ප්‍රධාන කාර්යයක් වන්නේ,

(1) සමර්පණයක ඇති අක්ෂර පරීක්ෂා කිරීමයි.
(2) ලේඛනයක ඇති වචන සංඛ්‍යාව ගණන් කිරීමයි.
(3) පරිගණක පද්ධතියක තිබෙන දෘඩාංග සම්පත් කළමනාකරණයයි.
(4) විද්‍යුත් තැපැල් ලිපි (e-mail) යැවීම හා ලබා ගැනීමයි.

**11.** පද්ධති සංවර්ධන ජීවන චක්‍රයේ අඩංගු ක්‍රියාකාරකම් කිහිපයක් A - H ලේබල් මගින් දක්වා ඇත.

A - පද්ධති සංවර්ධනය (system development)
B - ශක්‍යතා අධ්‍යයනය (feasibility study)
C - පද්ධති ස්ථාපිත කිරීම (system implementation)
D - පද්ධති නඩත්තුව (system maintenance)
E - ගැටලුව අර්ථ නිරූපණය (problem definition)
F - පද්ධති විශ්ලේෂණය (system analysis)
G - පද්ධති සැලසුම් කිරීම (system design)
H - හරි වැරදි පරීක්ෂාව (testing)

මෙම ක්‍රියාකාරකම් සිදු කළ යුතු නිවැරදි අනුපිළිවෙළ,

(1) A, E, H, B, F, G, C සහ D වේ.  (2) C, B, G, F, A, D, E සහ H වේ.

(3) E, B, F, G, A, H, C සහ D වේ.  (4) G, F, B, A, E, C, D සහ H වේ.

**12.** පහත දැක්වෙන ප්‍රකාශ සලකා බලන්න.

A - නිවසක සිට අන්තර්ජාලයට පිවිසීම සඳහා අන්තර්ජාල සේවා සැපයුම්කරුවකු (ISP) අවශ්‍ය වේ.
B - අන්තර්ජාලයේ පවතින සෑම සේවාදායක පරිගණකයක් (server computer) සඳහා ම අනන්‍ය ලිපිනයක් තිබිය යුතු ය.
C - ඇමුණුම් කළ හැකි උපරිම ගොනු විශාලත්වය (file size) නොඉක්මවන ඕනෑම ගොනුවක් විද්‍යුත් තැපැල් ලිපියකට ඇමුණුම් කළ හැකිය.

ඉහත වගන්ති අතුරෙන් නිවැරදි වන්නේ,

(1) A හා B පමණි.  (2) A හා C පමණි.  (3) B හා C පමණි.  (4) A, B හා C සියල්ලම ය.

**13.** පහත සඳහන් ගොනු නාම දිගු (file name extensions) සලකා බලන්න.

A - odt  B - docx  C - doc  D - rtf

වදන් සකසන මෘදුකාංග භාවිතයෙන් සකස් කරන ලද ගොනු සඳහා ඉහත සඳහන් කවරක් වලංගු වේ ද?


(1) A හා B පමණි  (2) B හා C පමණි  (3) C හා D පමණි  (4) A, B, C හා D සියල්ලම


**14.** වදන් සකසන මෘදුකාංගයක් භාවිතයෙන් A වගන්තිය B වගන්තිය ලෙස හැඩසවි (formatted) කර ඇත.

A වගන්තිය: Many people believe that Abacus is the foundation of the present computer.


B වගන්තිය: *Many people believe that Abacus is the foundation of the present computer.*

A වගන්තිය B වගන්තියේ පෙනුම ලබා ගැනීම සඳහා පහත කවර මෙවලම් භාවිත කර ඇත් ද?

(1) 

(2) 

(3) 

(4) 


**15.** ලේඛනයක අඩංගු ඕනෑම පාඨයක් (text) සොයා ගැනීම (find) සඳහා වදන් සකසන මෘදුකාංගයක ඇති පහත සඳහන් කවර නිරූපකය (icon) භාවිත කළ හැකි ද?

(1) 
(2) 
(3) 
(4) 

[තුන්වැනි පිටුව බලන්න.

**16.** සමර්පණ මෘදුකාංග සම්බන්ධ පහත දී ඇති වගන්ති සලකා බලන්න.

A: කදා සංක්‍රාන්ති (slide transitions) යනු එක් කදාවකින් තවත් කදාවකට මාරුවන විට ඇතිවන දෘශ්‍ය චලන (visual movements) වේ.

B: සජීවන (animations) යනු කදාවක ඇති තනි අයිතමයක් මත යෙදූ දෘශ්‍ය ආවරණ (visual effects) වේ.

C: සමර්පණයකට කටහඬ පටිගත කර ඇතුළත් කළ හැකි ය.

ඉහත වගන්තිය අතුරෙන් සත්‍ය වන්නේ,

(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) B හා C පමණි. (4) A, B හා C සියල්ලම ය.

● ප්‍රශ්න අංක **17** සහ **18** සඳහා මෙහි දක්වා ඇති පැතුරුම්පත් කොටස පාදක වී ඇත.

A5

| | A | B | C | D |
|---|---|---|---|---|
| 1 | 20 | 67 | | |
| 2 | 12 | 23 | | |
| 3 | 45 | 54 | | |
| 4 | 21 | 34 | | |
| 5 | | | | |
| 6 | | | | |

**17.** A1:A4 කෝෂ පරාසය තුළ ඇති විශාලතම සංඛ්‍යාව පෙන්වීමට A5 කෝෂයේ ලිවිය යුතු නිවැරදි සූත්‍රය කුමක් ද?

(1) =count(A1:A4) (2) =max(A1:A4)
(3) =rank(A1:A4) (4) =sum(A1:A4)

**18.** A1:B4 කෝෂ පරාසය තුළ ඇති ඇතුළත් කිරීම් (entries) ගණන පෙන්වීමට B5 කෝෂයේ ලිවිය යුතු සූත්‍රය කුමක් ද?

(1) =count(A1:B4) (2) =max(A1:B4)
(3) =min(A1:B4) (4) =sum(A1:B4)

**19.** පැතුරුම්පතක කෝෂයකට = 2 ^ 5 + 16 යන සූත්‍රය ඇතුළත් කරන ලදී. කෝෂයේ දිස්වෙන අගය කුමක් ද?

(1) 26 (2) 32 (3) 42 (4) 48

**20.** පහත පෙන්වා ඇති HTML ප්‍රකාශ(වගන්ති) සලකා බලන්න.

```
<dl>
    <dt> Coffee </dt>
    <dd> Hot Drink </dd>
    <dt> Milk </dt>
    <dd> Cold Drink </dd>
</dl>
```

ඉහත HTML කේත කොටසේ ප්‍රතිදානය විය හැක්කේ කුමක් ද?

| (1) | (2) | (3) | (4) |
|---|---|---|---|
| Coffee<br>Hot Drink<br>Milk<br>Cold Drink | Coffee<br>    Hot Drink<br>Milk<br>    Cold Drink | o Coffee<br>o Hot Drink<br>o Milk<br>o Cold Drink | o Coffee<br>    Hot Drink<br>o Milk<br>    Cold Drink |

**21.** වගුවක් නිර්මාණයට අදාළ පහත සඳහන් HTML වගන්ති සලකා බලන්න.

```
<table border =1>
    <tr> <th>Name</th> <th>Tel. Number</th> </tr>
    <tr> <td> Gunarathna</td> <td> 0115557770 </td> </tr>
    <tr> <td rowspan=2> Somasundaram</td> <td> 0115557771 </td> </tr>
    <tr> <td>0115557772 </td> </tr>
</table>
```

ඉහත ප්‍රකාශ මගින් නිර්මාණය කරනු ලබන නිවැරදි වගුව පහත සඳහන් කවරක් ද?

(1)

<table><tr><th>Name</th><th>Tel. Number</th></tr><tr><td rowspan="2">Gunarathna</td><td>0115557770</td></tr><tr><td>0115557771</td></tr><tr><td>Somasundaram</td><td>0115557772</td></tr></table>

(2)

<table><tr><th>Name</th><td>Gunarathna</td><td>Somasundaram</td></tr><tr><th rowspan="2">Tel. Number</th><td rowspan="2">0115557770</td><td>0115557771</td></tr><tr><td>0115557772</td></tr></table>

(3)

<table><tr><th>Name</th><th>Tel. Number</th></tr><tr><td>Gunarathna</td><td>0115557770</td></tr><tr><td rowspan="2">Somasundaram</td><td>0115557771</td></tr><tr><td>0115557772</td></tr></table>

(4)

<table><tr><th>Name</th><td>Gunarathna</td><td>Somasundaram</td></tr><tr><th rowspan="2">Tel. Number</th><td>0115557770</td><td rowspan="2">011555777 2</td></tr><tr><td>0115557771</td></tr></table>

55927

**22.** වගුවකට පේළියක් එකතු කිරීම පහත සඳහන් කවර HTML උසුලන (tag) සංයෝජනය කළ හැකි ද?
(1) <TR > </TR> (2) <CR> </CR> (3) <TH> </TH> (4) <TD> </TD>

**23.** අංකිත ලැයිස්තුවක් (numbered list) දර්ශනය කිරීම සඳහා පහත කවර HTML උසුලන සංයෝජනයක් භාවිත වන්නේ ද?
(1) <OL> </OL> (2) <UL> </UL> (3) <DL> </DL> (4) <LI> </LI>

**24.** දී ඇති අනුපිළිවෙළට ක්‍රියාත්මක වන පහත සඳහන් පැවරුම් (assignment) වගන්ති සලකා බලන්න.
*day* = 14
*today* = 18
*day* = *today*
ඉහත වගන්ති ක්‍රියාත්මක වූ විට *day* හා *today* හි අඩංගු වන අගයයන් පිළිවෙළින්,
(1) 14, 14 වේ. (2) 14, 18 වේ. (3) 18, 14 වේ. (4) 18, 18 වේ.

- **25** සිට **27** දක්වා ප්‍රශ්න පහත දත්ත සමුදාය මත පදනම් වී ඇත. දී ඇති වගු මගින් පොත් සාප්පුවක විකිණීමට ඇති පොත්වල (Books) සහ පොත් ප්‍රකාශකයන්ගේ (Publishers) දත්ත පෙන්වනු ලබයි.

| Book_ID | Book_Name | Quantity | Unit_Price |
|---|---|---|---|
| B001 | Exploring Moon | 5 | 250 |
| B002 | Wonders of the World | 20 | 200 |
| B003 | Art of Magic | 50 | 150 |
| B004 | Red Rackan's Treasure | 20 | 300 |

Book වගුව

| Book_ID | Publisher_ID |
|---|---|
| B001 | P003 |
| B002 | P002 |
| B003 | P002 |
| B004 | P001 |

Book_Publisher වගුව

| Publisher_ID | Publisher_Name | Publ_Phone |
|---|---|---|
| P001 | Williansons | 5566778 |
| P002 | Bertram Publishers | 2345678 |
| P003 | Siena and Sieana | 2356987 |
| P004 | United Books | 5587698 |

Publisher වගුව

**25.** Book වගුවේ ඇති Unit_Price සඳහා වඩාත් ම යෝග්‍ය වන දත්ත ප්‍රරූපය (data type) කුමක් ද?
(1) Currency (2) Date (3) Number (4) Text


**26.** Book වගුවේ ප්‍රාථමික යතුර (primary key) සඳහා වඩාත් ම යෝග්‍ය වන්නේ පහත සඳහන් කවරක් ද?
(1) Book_ID (2) Book_Name (3) Quantity (4) Unit_Price

**27.** ආගන්තුක යතුරකට (foreign key) උදාහරණයක් වන්නේ පහත සඳහන් කවර ක්ෂේත්‍රයක් ද?
(1) Book වගුවේ Book_Name (2) Book_Publisher වගුවේ Book_ID
(3) Publisher වගුවේ Publ_Phone (4) Publisher වගුවේ Publisher_Name

- **28** සහ **29** ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා *රූපය* 1 සහ ලබා දී ඇති ප්‍රතිබිම්බ සංස්කරණ මෘදුකාංගයක මෙවලම් තීරුව සලකා බලන්න.



*රූපය* 1




**28.** ඉහත *රූපය* 1 හි ඇති හාවාගේ රූපය ඇඳීම සඳහා වඩාත් සුදුසු මෙවලම කුමක් ද?
(1) P (2) Q (3) R (4) S

**29.** *රූපය* 1 හි ඇති නිවසෙහි වහලය සහ දොර වර්ණ ගැන්වීම සඳහා භාවිත කළ යුතු වඩාත් සුදුසු මෙවලම කුමක් ද?
(1) P (2) Q (3) S (4) T

**30.** ප්‍රතිබිම්බ සංස්කරණ මෘදුකාංග භාවිතයේ දී, ප්‍රතිබිම්බයක (image) තිබෙන නිසි ආකාරයේ හැඩයක් නොමැති පෙදෙසක් (irregularly shape) තේරීම සඳහා භාවිත කරන්නේ පහත කවර මෙවලමක් ද?
(1)  (2)  (3)  (4) 

**31.** 72 ppi විභේදනයක් (resolution) සහිත 1" × 1" ප්‍රමාණයේ පවතින ප්‍රතිබිම්බයක (image) අඩංගු පික්සල (pixcel) ප්‍රමාණය කොපමණ ද?

(1) පික්සල 72 (2) පික්සල 144 (3) පික්සල 2592 (4) පික්සල 5184

**32.** පරිගණක පද්ධතියකට, වයිරස් ආසාදනයක් නිසා ඇතිවිය හැකි අනිසි ප්‍රතිඵලයක් වීමට **නොහැක්කේ** පහත කවරක් ද?

(1) පරිගණකයේ ඇති දත්ත හා තොරතුරු දූෂණය වීම (corruption)
(2) පරිගණක දෘඩාංගවලට හානි සිදු වීම
(3) පරිගණකයේ ඇති දත්ත හා තොරතුරු වෙනස් වීම
(4) පරිගණකයේ ක්‍රියාකාරිත්වයේ කාර්යක්ෂමතාව අඩු වීම

**33.** වයිරස් ආසාදනයකින් පරිගණක පද්ධතියක් ආරක්ෂා කර ගැනීම සඳහා ගත හැකි සුදුසු ක්‍රියා මාර්ග පහත සඳහන් ඒ අතුරෙන් කවරක් ද?

A - ලැබෙන විද්‍යුත් ලිපි ඇමුණුම් (attachments) පිළිබඳව දැඩි අවධානයක් දැක්වීම
B - බාහිර ආචයන උපක්‍රම භාවිතයේ දී සැලකිලිමත් වීම
C - මෘදුකාංගවල ඇති සාර්ව පහසුකම (macro facility) අක්‍රිය කිරීම


(1) A හා B පමණි (2) A හා C පමණි (3) B හා C පමණි (4) A, B හා C සියල්ලම

**34.** පරිගණකයක් මිලදී ගැනීමේ දී පහත සඳහන් කවරක් සලකා බැලීම ප්‍රයෝජනවත් වේ ද?

A – පරිගණකයේ වෙළඳ නාමයේ කීර්තිය (reputation)
B – වෙළෙන්දාගේ කීර්ති නාමය
C – පරිගණකයේ වගකීම් කාලය

(1) A පමණි (2) B පමණි (3) A හා B පමණි (4) A, B හා C සියල්ලම

**35.** දී ඇති ගැලීම් සටහන් කොටසේ ඇති තර්කයට තුල්‍ය වන ව්‍යාජ කේත (Pseudocode) කොටස කුමක් ද?




(1)
```
if A > 25 then
    Do P
else
  if B < 10 then
    Do Q
  else
    Do R
  end if
end if
```

(2)
```
if A < 25 then
    Do P
else
  if B < 10 then
    Do Q
  else
    Do R
  end if
end if
```

(3)
```
if A > 25 then
    Do P
else
  if B < 10 then
    Do R
  else
    Do Q
  end if
end if
```

(4)
```
if A > 25 then
    Do P
else
  if B > 10 then
    Do R
  else
    Do Q
  end if
end if
```

**36.** 1 සිට 10 තෙක් වූ සුචි පරාසයක් (index range) සමඟ '*marks*' නම් වූ අරාවක (array) සිසුවකුගේ විෂයන් 10ක ලකුණු ආචයනය කර ඇත. එම ලකුණුවල සාමාන්‍ය (average) ගණනය කිරීම සඳහා ව්‍යාජ කේතය (pseudocode) Ⓟ, Ⓠ, Ⓡ නම් වූ ලේබල සමඟින් පහත දක්වා ඇත.

```
total_marks = Ⓟ
for i = 1 to 10
begin
    total_marks = total_marks + marks[Ⓠ]
end
average_marks = total_marks / Ⓡ
```

Ⓟ, Ⓠ සහ Ⓡ ලේබල සඳහා අගයයන් පිළිවෙළින්,

(1) 0, 10 සහ *i* වේ. (2) 0, *i* සහ 10 වේ. (3) 10, *i* සහ 10 වේ. (4) 10, 10 සහ *i* වේ.

**37.** පහත දැක්වෙන '*while*' ලූපය කොපමණ වාරයක් ක්‍රියාත්මක වේ ද?

```
count = 9
while count >= 3
      count = count – 2
end while
```

(1) 2 (2) 4 (3) 6 (4) 8

**38.** පහත දැක්වෙන ව්‍යාජ කේත (pseudocode) කොටස සලකා බලන්න.

```
OddTotal = 0
count = 0
CurrentOdd = 1
while count <= 3
        OddTotal = OddTotal + CurrentOdd
        CurrentOdd = CurrentOdd + 2
        count = count + 1
end while
print OddTotal
```

ඉහත ව්‍යාජ කේත කොටසේ ප්‍රතිදානය කුමක් ද?

(1) 9 (2) 16 (3) 25 (4) 36

**39.** පහත දැක්වෙන ව්‍යාජ කේත කොටස සලකා බලන්න.

```
if average_marks > 50 then
   if failed_subjects = 0 then
     scholarship = 'True'
   end if
end if
```

ඉහත ව්‍යාජ කේත කොටසේ ඇති තර්කයට සමාන වන්නේ පහත සඳහන් කවරක් ද?

(1) If average_marks > 50 AND failed_subjects = 0 Then scholarship = 'True'
(2) If average_marks > 50 OR failed_subjects = 0 Then scholarship = 'True'
(3) If average_marks > 50 then failed_subjects = 0 Else scholarship = 'True'
(4) If average_marks > 50 then scholarship = 'True' Else failed_subjects = 0

**40.** පහත දක්වා ඇති '*while*' සහ '*repeat until*' ලූප (loops) සලකන්න.

```
count_A = 1
while count_A <= 10
  count_A = count_A + 2
end while
```

```
count_B = 1
repeat
  count_B = count_B + 2
until count_B <= 10
```

*while* හා *repeat until* යන ලූප දෙක ක්‍රියාත්මක වීම සම්පූර්ණ වූ විට *count_A* සහ *count_B* හි අගයයන් පිළිවෙළින් කුමක් ද?

(1) 9 සහ 9 (2) 9 සහ 11 (3) 11 සහ 9 (4) 11 සහ 11

* *